
නිවුන්
වික්‍රමය
චෙතුජ් නෙත්සාරා

# නිවුන් විකුමය


## එච්.එච්. ටෙනූජි නෙත්සාරා

<u>කතෘ</u>

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

8 – E



2025.02.08

ISBN 978-624-208-645-3

# - පිදුම -

සැමදා මාගේ යහපත ම ප්‍රාර්ථනා කරන
අම්මාට හා තාත්තාටත්

සිප් සයුරෙන් අපව එතෙර කරන්නට වෙර දරන
ගුරුමැණිවරුන්ට හා පියවරුන්ටත්

වචනයකින් හෝ මා දිරිමත් කළ
සියළු දෙනාටත්

මෙම පොත සෙනෙහසින් යුතු ව
පුද කරමි !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


1. රණ්ඩුව

2. ආසාව

3. වෙනස

4. උපන් දිනය

5. සමු ගැනීම

6. ආපසු ලංකාවට

7. අළුත් පාසල

8. කෝච්චියෙන් ගමනක්

9. වාර විභාගය

10. ගල උඩ

11. ගුහාව

12. පුදුමයකි

13. දැනුම් දීම

# 1. රණ්ඩුව

වෙලාව හවස 4.00 පමණ ඇත. පාසලේ දුන් ගෙදර වැඩ නිම කල සෙනුරි සඳළුතලයට ගොස් අරමුණකින් තොරව ඈතින් පෙනෙන කඳු වැටිය දෙසට නෙත් යොමාගෙන සිටියා ය. ගස් වැල් විවිධ හැඩ වලින් නේක විද ප්‍රමාණවලින් යුක්ත ව හරිත වර්ණයෙන් බබළයි. කඳු යායේ ඉහළින්ම ඇති ගස් අහසට ලං වී අහස සමග කුමක් හෝ කොඳුරන්නා සේ ඇයට පෙනේ. මෙය නම් චිත්‍රයක් වැනි යැයි ඇයට සිතුනා ය. හැමදාම සඳළුතලයට ගියවිට පෙනෙන මේ කන්දේ අද අමුතුම ලස්සනක් ඇයට පෙනුනි. "මේ කන්ද කොච්චර ලස්සන වුණත් ලංකාවේ තියෙන කඳු මීට වඩා කොච්චර ලස්සනද?" සෙනුරි ඇයටම කියා ගත්තා ය. ඇය මේ අපූරු සිහින ලෝකයෙන් මිදුනේ අම්මාගේ හඩ ඇසීමෙන් තිගැස්සීම නිසා ය. " දුව මේ තේ එක අයියට ගිහින් දෙන්න" "හරි අම්මා" ඇය තේ එක රැගෙන අයියගෙ කාමරයට ගියා ය. "ඒයි ආ ගන්න" ඇය ඕනෑවට එපාවට මෙන් තේ එක මේසය මත තැබුවා ය. "මොකද ඒයි මෙයි ගාන්නේ ඇයි අයියා කියන්න බැරිද" සෙනුර තරහින් ඇසුවේ ය. " විනාඩි 15 කින් වැඩිමල් වුණා කියල අයිය කියන්න ඕනෙම නැනෙ" සෙනුරි පසු නොබැස්සා ය. අවසානයේ ඔවුන් දෙදෙනාගේ මේ රණ්ඩුව අවසන් වූයේ අම්මාගේ මැදිහත් වීමෙනි.

නිවුන් සහෝදර සහෝදරියන් වන ඔවුන් දෙදෙනා සැම විටම කුමක් හෝ වැඩකට නැති හේතුවක් නිසා අඩ දබර සිදුකර ගනී. කෙසේ හෝ මේ රණ්ඩුව අවසන් වී සෙනුරි තරහින් සෙනුරගේ කාමරයෙන් පිට වන්නට හදනවාත් සමග ම මේසය මත තිබූ තේ කෝප්පය ඇයගේ අත වැදී බිම වැටුණි. එය විශාල ශබ්දයක් නිකුත් කරමින් කෑලිවලට කුඩු වී කාමරය පුරා විසිර යන්නට විය. “අයියෝ මේ මම කැමතිම කෝප්පේ ඒයි බලනවා තමුසේ මේ මොනාද කරේ කියලා” සෙනුර තරහින් පුපුරමින් කීවේ ය. එවිට සෙනුරි “ ඉතින් ඔයානෙ මේක ඉස්සෙල්ල ම පටන් ගත්තේ” යැයි කියන විට “ කට වහ ගන්න ව කවුරු පටන් ගත්තත් කමක් නෑ ආපහු මම එනකොට මේ කුඩු ටික දෙන්නත් එක්ක එකතු වෙලා අහුලලා තිබ්බෙ නැත්නම් මම කියනවා තාත්තට දෙන්න ගැනම තේරුණාද ?” යනුවෙන් අම්මා තරහින් පුපුරමින් කියා කාමරයේ දොර වේගයෙන් වසමින් පිට වී ගියා ය. “අයියෝ දැන් මේක අස් කරන්නත් එපැයි එනව මෙතන බලාගෙන ඉන්නෙ නැතිව මේක අස් කරන්න” සෙනුර කීවේ ය. සෙනුරි ද විවිධ දෑ කියමින් එය අස් කිරීමට අයියාට උදවු කළා ය. කෙසේ හෝ ඔවුන් දෙදෙනාට ම එදින නින්දට යාමට සිදු වූයේ බැනුම් කෝටියක් ඇසීමෙන් අනතුරුව ය.

## 2. ආසාව

සෙනුරි පාසල් ගොස් නිවසට පැමිණියා ය. ඇග පත සෝදා ගෙන විත් පාසලේ ගෙදර වැඩ නිම කර ඇගේ සුපුරුදු ස්ථානය වන කාමරයේ සඳළුතලයට පැමිණියා ය. ඇගේ නිවසේ ඇය බෙහෙවින් ම ප්‍රිය කරන ස්ථානය මෙයයි. ඇය සෑම දිනකම මෙම සඳළුතලයට වී එහි ඇතින් දිස්වන රමණීය දසුන දෙස බලා සිටී. “ අනේ මට ලංකාවට යන්න ඕනේ මට තවත් මෙහෙ ඉන්න බෑ” සෙනුරි ඇයටම කියා ගත්තා ය. ඇය ඕස්ට්‍රේලියාවට පැමිණියේ ඇයට වයස අවුරුදු අටේදී ය. දැන් ඇයට අවුරුදු දහතුනක් වීමට අසන්න ය. සෙනුරිට මෙහි කිසිවකින් අඩුවක් නැත. අවශ්‍ය සියලුම දෑ කලට වේලාවට ලැබේ. එහෙත් ඇයට නොමැති එක ම දෙය වන්නේ හිතේ සතුටයි. හිත සතුටු වන කොපමණ දේවල් සිදු වුවත්, සිදු කලත් ඇයට යම් අඩුවක් දැනේ. ඒ ඇයට සුපුරුදු ඇය ඉපදුණු මව්බිමයි. ඇය ලංකාවට පුදුම තරම් ආදරේ කළා ය. කුඩා කල කෙළි සෙල්ලමට ම ලොල් වූ සිත සෑම විට ම දිව ගියේ සෙල්ලම දෙසට ම ය. කුඩා කළ සිටම දුකේදීත් සැපේදීත් එකට ම සිටි තම හොදම මිතුරිය වූ ගිහන්සි සමග සෙල්ලම් කළ ආකාරය ඇයට තාම මතක ය. ඇය සෑම විට ම මේ මතක තුළ ජීවත් වූවා ය. මේ පිළිබද සිතන විට ඇයට ලංකාව දැකීමට ඇති ආසාව තවත් වැඩි වේ.

“ මේ ගැන අම්මට කියන්න ඕනෙ” යැයි සිතූ ඇය අම්මා සොයා දිව ගියා ය. “අම්මේ, මේ... අපි ආයෙ ලංකාවට යන්නේ නැත්දැ” යි සෙනුරි ඇසුවා ය. “ ඇයි දුවට එකපාරට ම ලංකාව මතක් වුණේ” අම්මා ද පෙරලා ප්‍රශ්නයක් ඇසුවා ය. “ මට මෙහේ ඉදල එපා වෙලා තියෙන්නේ අනේ අම්මේ අපි ආපහු ලංකාවට යමුකෝ”
“ඔය කියන ඉක්මනට ලංකාවට යන්න බැනෙ දුව අයියත් මට ඕක ම කිව්වා. මම තාත්තට කියල බලන්නම්” අම්ම පිළිතුරු දුන්නා ය. වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වන සෙනුරිගේ පියා නිවසට පැමිණෙන්නේ රෑ බෝ වූ පසුව ය. වෛද්‍ය වෘත්තිය කොතරම් නම් කාර්යබහුලද?. ඔවුන්ට ඔවුන්ගේ පවුලේ අයත් සමග සිටීමට ඇති කාලය ඉතා අල්ප ය. එබැවින් මෙවැනි දෙයක් ගැන සිතීමට කාලයක් ඔහුට නැතැයි සෙනුරි සිතුවා ය. ඇය තම අයියාව හමු වීමට ගියා ය.
“අයියේ ඔයාටත් මෙහෙ ඉදල ඇති වෙලාද තියෙන්නේ”
“හ්ම්”
“මටත් එහෙම තමයි”
“ඔයා ඒක ගැන අම්මට කිව්වද?”
“ඔව් අම්ම කියනවා තාත්තගෙන් අහල බලන්නම්ලු”
“හ්ම්”
මේ ඔවුන් දෙදෙනා මෙසේ සමගියෙන් කතා කළ පළමු වතාව වන්නට ඇත.

* * * * *

රෑ 9.30 පමණ වන විට සෙනුරි ඇදට වැටුණා ය. ඇය මේ ගැනම කල්පනා කරමින් නින්දට යන විට රෑ 10.00 පමණ වන්නට ඇත. සෙනුරිගේ මේ සුන්දර බලාපොරොත්තුව බලාපොරොත්තුවක් පමණක් ම වේවිද? නැතිනම් එය ඉටු වේවිද?

## 3. වෙනස

සති අන්තයෙන් පසු සෙනුරි පාසල් යාම සඳහා සූදානම් වුවා ය. වෙනදා සෑම විට ම උද්යෝගිමත් ව ක්‍රියාශීලී ව සිටින ඇය ටිකෙන් ටික සෑම කටයුත්තකට ම මැලි බවක් දැක්වූවා ය. පාසලේ යහළුවන් සමග ද ඇය වැඩියෙන් කතා කළේ නැත. ඔවුන් ඇසූ ප්‍රශ්නයකට පමණක් ඇය පිළිතුරු දුන්නා ය. නැවත නිවසට පැමිණි පසුත් සෙනුරි බොහෝ විට තම කාමරයට ම වී කල් ගත කළා ය. අරමුණකින් තොර ව බලාගත්තු අත දෙස ම බොහෝ වේලාවක් බලා සිටියා ය. ගෙදර අයත් ඇගේ මේ වෙනස හොඳින් ම තේරුම් ගෙන තිබුණි.

"ඇයි දුව ඔයා මෙහෙම අපිත් එක්ක කතා කරන්නේ නැතුව ඉන්නේ?" දිනක් අම්මා සෙනුරිගේ කාමරයට පැමිණ ඇසුවා ය.

"මොකුත් නෑ අම්මා " ඒ සෙනුරිගේ පිළිතුරයි.
"මොකුත් නැත්නම් ඔයා ඔහොම ඉන්න විදිහක් නෑනේ "

තම හිතට වද දෙන එම හේතුව අම්මාට කීමට උත්සාහ කළත් ඇය එම අදහස ආයාසයෙන් මැඩ පවත්ව ගත්තේ ඒ පිළිබඳ නැවත නැවත මතක් කිරීමෙන් අම්මාට තරහ යාමට ඉඩ ඇති නිසා ය.

"මේ... එහෙම මොකුත් නෑ අම්මේ මම සාමාන්‍ය විදිහට ම තමයි ඉන්නේ"
"අනේ මන්දා මට නම් තේරෙන්නේ නෑ ඔයාට මේ මොකද වෙලා තියෙන්නේ කියලා" යැයි කියමින් අම්මා කාමරයෙන් පිටව ගියා ය.

සෙනුරි පසුදින පාසල් ගියා ය. ඇගේ මේ වෙනස ඇයගේ පන්තිභාර ගුරුතුමියටත් ප්‍රශ්නයක් වී තිබුණි. මෙයට හේතු විමසීමේ අටියෙන් ගුරුතුමිය විවේක කාලයේ දී ඇය හමුවීමට ගුරු විවේකාගාරයට පැමිණෙන ලෙස සෙනුරිට දැනුම් දුන්නා ය.
තමාව මේ වෙලාවේ ගුරුතුමිය කැඳවන්නේ කුමකට දැයි සෙනුරිට බිය මුසු කුතුහලයක් ඇති විය.

මැඩම් මොකටද මට මේ වෙලාවේ කතා කරන්නේ? මට බනින්නවත්ද? ඒත් ඉතින් මම වැරැද්දක් කළේ නෑනේ? නැත්නම් මොකක් හරි දෙයක් ගැන ප්‍රශ්න කරන්නද? ඒත ඒ මොකක් ගැනද? ආදී දේවල් ගැන සිතමින් සිතුවිලි දාමයක පැටලී සිට ඈ නොදැනුවත්වම ගුරු විවේකාගාරය වෙතට පැමිණ තිබුණි. ඇය සෙමෙන් සෙමෙන් පන්තිභාර ගුරුතුමිය වෙතට පිය නැගුවා ය.

" සමාවෙන්න මැඩම් මම එන්නද" සෙනුරි ආචාරශීලීව ගුරුතුමියට පැවසුවා ය.

“ආ… සෙනුරි මම ඔයාට එන්න
කිව්වේ ඔයාගෙන් දෙයක් ගැන
අහන්න” .ගුරුතුමිය පැවසුවා ය.

සෙනුරි එකවර ම තිගැස්සී ගියා ය. මැඩම් මොකද්ද මගෙන් අහන්න යන්නේ ඇය ගුරුවරුන් සමග කතා කිරීමට මදක් බිය බවක් දැක්වූවා ය. ඉතින් ඇය කතා කිරීමට උත්සාහ කළත් වචන පැටලුනා ය.

“මො… මොකක් ගැනද මැඩම්”

“ නෑ නෑ බය වෙන්න එපා. මම මේ අහන්න හැදුවේ, මම දැක්ක මේ දවස් ටිකේ ම ඔයා මොකක් හරි දෙයක් ගැන හිත හිත දුකින් ඉන්නවා. ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවනම් මට කියන්න මම පුළුවන් උදව්වක් කරන්නම්”.

කරුණාවන්ත තැනැත්තියක් වූ සෙනුරිගේ ගුරුතුමියට තම පන්තියේ සිටින සිසුන්ගේ මෙවැනි වෙනස්වීම් හොඳින් හඳුනාගත හැකි ය.

ගුරුතුමියටත් මෙය තේරී ඇත. සෙනුරිට මෙයට හේතුව පැවසීම හැර වෙනත් විකල්පයක් නොතිබුණි.

“මැඩම් මට මේ දවස් ටිකේ ම කොච්චර සතුටු වෙන්න පුළුවන් වුනත් මොකක් හරි අමුතු දුකක් දැනෙනවා.

මගේ රට ලංකාවනේ. ඉතින් මට හැම වෙලාවෙම ලංකාව මතක් වෙනවා. මම මෙහෙට ආවෙ පොඩි කාලේ. මට දැන් මෙහෙ හිටියා ඇති කියල තමයි හිතෙන්නේ මම අම්මටත් කිව්වා ලංකාවට යමු කියල. අම්ම කිව්වා තාත්තටත් කියල බලන්නම් කියල. ඒ වුණාට මට හිතෙන්නේ තාත්තට ඒව ගැන හිතන්න වෙලාවක් නැතිව ඇති. ඉතින් මම කොච්චර හිත හදා ගන්න බැලුවත් මට ලංකාව අමතක කරන්න අමාරුයි. ඒක හින්ද වෙන්නැති මැඩම්ට මම දුකින් ඉන්නවා වගේ පේන්නේ'' සෙනුරි ඇයගේ කතාව අවසන් කළා ය.

“මට තේරෙනවා සෙනුරි. කාට වුණත් තමන් ඉපදුණු රට වගේ වෙන මොන රටක්වත් හොද නෑ.මම මොකක් හරි කරන්න බලන්නම්කෝ'' යැයි ගුරුතුමිය කියා අවසන් වන විට ම විවේක කාලය අවසන් වන සීනුව නාද විය.

“ මම ගිහින් එන්නම් මැඩම්'' යනුවෙන් ගෞරවාන්විතව පැවසූ සෙනුරි තම පන්තිය කරා ඉක්මන් පියවර තැබුවා ය.

සෙනුරිට උදව් කරන්නේ කෙසේ දැයි කල්පනා කරමින් සිටි ගුරුතුමිට යම් අදහසක් පහළ විය. හැබැයි එම අදහස හරියාවිදැයි කීමට අපහසු ය.

# 4.උපන් දිනය

සෙනුරි වෙනදා මෙන් නොව මෙදින උදැසන ම නැගිට පාසල් යාමට සූදානම් වී නිවසේ පහත මාලයට පැමිණියේ උදැසන ආහාරය ගැනීමටය. උදැසන ආහාරය ගැනීමට කියා කීවත් ඇත්ත වශයෙන් ම ඇය පැමිණියේ තමාට පළමුවෙන්ම සුභ පතන්නේ කවුරුන්දැයි දැන ගැනීමට ය. අවුරුදු දහ තුනක් යැයි කීවත්සෙනුරිට හා සෙනුරට දහතුන සම්පූර්ණ වන්නේ අද දිනටය. පහත මාලයට පැමිණියත් ඇය බලාපොරොත්තු වූ දෙය සිදු වූයේ නැත. තාත්තා උදැසනින්ම වැඩට ගොස් තිබුණි. අම්මා ද කුස්සියට වී කුමක්දෝ වැඩක නිරත වෙමින් සිටියා ය. ඇය කෑම මේසයට ගොස් " අද දවස මතකද" යැයි රහසින් ඇසුවා ය. අයියා ඔව් කියන්නට මෙන් ඔළුව වැනුවේ ය.

"අම්මා සුභ පැතුවාද?"

"නෑ"

"හ්ම්"

සෙනුරි දුකින් ඉවත බලා ගත්තා ය. අම්මාට හා තාත්තාට සෙනුරගේ හා සෙනුරිගේ උපන් දිනය පවා අමතක වී ගොස් ය. වෙනදට මුලින්ම සුභ පතන්නේ අම්මා හෝ තාත්තා ය. සෑම අවුරුද්දක ම කුමක් හෝ හොද වැඩකට කටයුතු සූදානම් කරන්නේ ද ඔවුන් ය.

කේක් කපා දරුවන් සතුටු කරන්නේ ද ඔවුන් මය. එහෙත් මේ අවුරුද්දේ සිදු වී ඇත්තේ කුමක්ද?. ඔවුන්ට සුභ පතන්න පවා මව්පියන්ට අමතක වී ගොස් ය. ඔවුහු උදේ ආහාරය ලබා ගෙන දොම්නස් සිතින් යුතු ව පාසල් බස් රථයට ගොඩ නැගුණෝ ය.

*　　*　　*　　*　　*

පාසල අවසන් වී බස් රථයෙන් පැමිණ නිවස ළගින් බැසගත් ඔවුහු නිවසේ දොර විවෘත කර ගෙතුලට ගියහ. ගෙතුලට ඇතුළු වන විට ම සෙනුරට හා සෙනුරිට දැක ගත හැකි වූයේ අදහා ගත නොහැකි දෙයකි. මුළු සාලය පුරාම බැලුන් එල්ලා අලංකාර කර තිබුණි. එවිටම තාත්තා හා අම්මා උපන්දින ගීතය ගයමින් කේක් එකක් ද සමගින් ඔවුන් ඉදිරියට පැමිණියෝ ය. සිදු වූ දෙය කුමක්දැයි අදහා ගැනීමට නොහැකිව සෙනුර හා සෙනුරි ගල් ගැසී ඒ දෙස බලා සිටියහ.

“ ඉටිපන්දම නිවන්න” යනුවෙන් කියූ අම්මාගේ කටහඬින් තිගැස්සී, පියවි සිහියට පැමිණි ඔවුන් දෙදෙනා එක්වී ඉටිපන්දම නිවුවෝ ය. නිල ඇඳුම පිටින්ම කේක් කපා කවා සතුටු වූ ඔවුහු තම කාමර වෙත පියනැගුවේ ඇග පත සෝදා ගැනීමට ය. කිසිවක් නොදන්නා ආකාරයට රග පෑ අම්මා සහ තාත්තා අවසානයේ ඔවුන් හීනෙකින්වත් නොසිතූ ආකාරයට තම දරුවන්ව පුදුම කරවා ඇත.

පිරිසිදු වී ඇඳුම් මාරු කරගත් නිවුන් දරුවන් දෙදෙනා පාසලේ වැඩ නිම කර පහත මාලයට පැමිණියේ රාත්‍රී ආහාරය ගන්නා වේලාවටයි.

“ ආ.. එන්න, එන්න මට ඔයාලට දෙන්න දෙයක් තියෙනවා” තාත්තා කිව්වේය. ඔවුහු කුතුහලයෙන් යුතු ව තාත්තා ළඟට ගියෝ ය. තාත්තා ඔවුන්ට කුඩා තෑගි පෙට්ටි දෙකක් දුන්නේය. සෙනුරි හා සෙනුර සතුටින් ඉපිලී ගිය හා පැටවුන් මෙන් තෑගි පෙට්ටි දෙක හැර බැලුවෝ ය. එහි තිබුණු දෙය දුටු සෙනුර හා සෙනුරි එක් වරම උඩ පනිමින් සතුටින් කෑ ගැසූහ. සෙනුරිට නම් මෙය සිහිනියක් මෙනි. ඇය ඒ දෙස නැවත වරක් හොඳින් බැලුවේ මෙය සත්‍යක් දැයි සැක හැර දැන ගැනීම සඳහා ය. එහි වූයේ ඔවුන් දෙදෙනාට ලංකාවට යාමට අවශ්‍ය ගුවන් ගමන් බල පත්‍රයි. මේ මොහොතේ සෙනුරිට ඇති වූ සතුට වචනයෙන් කියා නිම කල නොහැක.

ඔවුන් ගැන සිතීමටවත් තාත්තාට වේලාවක් නැතැයි සිතූ සෙනුරිට අවසානයේ තාත්තා ඇයටත් නොකියාම ගුවන් ගමන් බල පත්‍රය පවා සාදා දී අවයන් ය. අම්මාට සහ තාත්තාට මේ සඳහා කෙසේ ස්තූති කරම් දැයි සෙනුරිට සිතා ගැනීමට නොහැකි විය.

“ අපි කවද්ද ලංකාවට යන්නේ “ සෙනුරි ඇසුවා ය

“ ලබන මාසේ යමු “ අම්මා පිළිතුරු දුන්නා ය.
“ ඔයාලට සිංහල ලියන්නත් පුරුදු වෙන්න වෙයි දැන් මතකත් නැතිව ඇතිනේ” ඒ කීවේ තාත්තා ය.
ඔවුන්ට හොඳින් සිංහල කතා කිරීමට හැකි වුවත් පාසලේදී ඔවුන්ට සම්පූර්ණයෙන් ම ඉගැන්වීම් කටයුතු සිදු කළේ ඉංග්‍රීසි මාධ්‍යයනි. එම නිසා මොවුන්ට සිංහල ලිවීම තරමක් අමතක වී තිබුණි.

මේ අයුරින් අදහා ගත නො හැකි ආකාරයට සෙනුර හා සෙනුරි ව සතුටු කිරීමට යෝජනා කළේ කවුරුන්ද? මෙම සිදුවීම සෙනුරිගේ පාසලේ පන්තිභාර ගුරුතුමිය සම්බන්ධද? ආදී නේකවිද ප්‍රශ්න සෙනුරිට අම්මාගෙන් ඇසීමට සිතුණත් ඇය එසේ නොකලේ මෙය කුතුහලය පිරුණු සිදුවීමක් ලෙස සිතේ තබා ගැනීමට ඇය තීරණය කල නිසා ය.

## 5.සමු ගැනීම

සෙනුරි උදෑසන පාසලට ගියා ය. අද ඇයට තරමක් නො සතුටු දිනයකි. ඇය අද පාසලෙන් අස්වීම ලබා ගන්නා දිනයයි. සෙනුරගේ අස්වීම ඊට පෙර දින ගෙන තිබුණි.සෙනුරි අද පාසලෙන් යන බව පාසලේ ඇයගේ ළඟින්ම සිටි මිතුරිය දැන සිටියා ය. ඇයද සිටියේ දුකිනි. මේ වන විට අම්මා පාසලට පැමිණෙන්නට ඇතැයි සෙනුරි සිතුවා ය. තමා කැටුව යාම සඳහා අම්මා පන්තිය අසලට පැමිණෙන තුරු ඇය ඇඟිලි ගනිමින් බලා සිටියා ය. පාසල නිමවීමට ඇත්තේ තව පැයක කාලයකි. අම්මා පැමිණෙන පාටක් නැත. ඒ පිළිබඳව කිසිවෙක් පණිවිඩයක් රැගෙන ආවේ ද නැත. තවත් පැය බාගයක් ගෙවී ගියේ ඇයගේ ඉවසමේ සීමාව බිඳ හෙලමිනි. දැන් දැන් අයගේ සිතට බියක් ද ඇතුළු වන්නට විය. මෙසේ සිතමින් සිටින විට සෙනුරිගේ මව පන්තිභාර ගුරුතුමිය ද සමඟ පන්තියට පැමිණියහ. ගුරුතුමිය ළමයින් ඇමතුවා ය.

“ අපේ පන්තියේ ඉන්න සෙනුරි අද මේ ඉස්කෝලෙන් අස් වෙනවා එයාගේ රට ලංකාවනේ. ඉතින් එයා ආපහු ලංකාවට යනවලු’’. ගුරුතුමිය පැවසුවා ය.

ළමයි හැමෝ ම පුදුමයෙන් සෙනුරි දෙස බැලුවෝ ය. ඔවුහු අතට අත දී සෙනුරිට සමු දුන්නෝ ය.

“ අනේ ! ඔයා ගියාම අපිට පාළුයිනේ” එය කීවේ ඇගේ මිතුරියෙකි.

“ ඔව්, මටත් ඔයාල ව ගොඩක් මතක් වෙයි.” සෙනුරි ද පැවසුවා ය.

සෙනුරිගේ ළග ම සිටි මිතුරිය ඇය දෙස දුකින් බලා සිටියා ය. ඇගේ ඇස් වල කඳුළු පිරී තිබෙනු සෙනුරි දුටුවා ය. කිසිවෙකුට කරදරයක් නොකරන, කිසිවෙකු සමග රණ්ඩුවට නොයන සෙනුරිගේ ගතිගුණවලට පන්තියේ සෑම ළමයෙකු ම කැමති විය. පන්තියේ හැමට ම සමුදුන් ඇය ගුරුතුමිය හා මව අසලට පැමිණියා ය.

“ දැන් හරි නේද ඔයාගෙ ආසාව? එහෙට ගිහිල්ලත් හොදට ඉගෙන ගන්න ඕනෙ. තේරුනා ද?” ඒ ගුරුතුමිගේ වදන් ය.

සෙනුරි ‘ඔව්’ යැයි පැවසීමට ඔළුව වැනුවා ය. ගුරුතුමියට සමුදුන් ඇය අම්මා ද සමග පන්තියෙන් එළියට පැමිණියේ නිවස බලා පිටත්ව යාමට ය. පාසලේ ඇති ගස් ඇය යනවාට දුකින් ඇය දෙස බලා සිටිනවා වැනිය. සිහිල් සුළං පොදක් පැමිණ සෙනුරිගේ ගත වෙලාගත්තේ ඇයට සමුදීමට මෙනි. ලංකාවට යන ඒ දවස උදා වීමිට ඇත්තේ තව ටික කාලයකි.

## 6. ආපසු ලංකාවට

ලංකාවට යාමට ඇත්තේ තව සතියයි. ඒ සඳහා බඩු සූදානම් කර ගත යුතුය. සෙනුරි තමාගේ බඩු ඉතා සතුටින් යුතුව සූදානම් කළා ය. අවුරුදු ගණනක් සිටි මෙම රටින් පිටවීමට ඇත්තේ තව ටික දවසකි. සෙනුරි මෙම නිවසේ ඇගේ කැමති ම ස්ථානය වූ කාමරයේ සදළුතලයට වී වැඩි වෙලාවක් ගත කළේ, සිත් කළු දසුනක් මවා පාන එතැන නිදහසේ කල් ගත කිරීමට ඇත්තේ තව ටික දවසක් නිසා ය.

* * *

ලංකාවට යන දවස උදා විය. ඇය සිතන අයුරින් මේ සෙනුරිගේ ජීවිතයේ ඇය කැමති ම දවසයි. සෙනුරි සතුටින් ඉපිලෙමින් ඒ සඳහා සූදානම් වූවා ය. ඔවුන් සිටි ගෙදර අයිතිකරුවන්ට බාර දෙන මොහොත උදාවිය. ඔවුන් මෙතෙක් කල් සිටි නිවස එයයි. එය බාරදෙන විට පුංචි දුකක් සිතට ඇතුළු වූවත් ඔවුන් යන්නේ කෙතරම් සතුටු තැනකටදැයි කියා සිතූ විට දී ඒ දුක පහව ගියේ ය.

පැය තුනක පමණ ගමනකින් පසුව ඔවුන් ගුවන්තොටුපොලට පැමිණියහ. ගුවන්තොටුපොලේ පැය කිහිපයක් ගත කළ ඔවුහු ගුවන් යානය පැමිණි විට එයට ගොඩවැදුණා ය. ලංකාවට යාම සඳහා ඔවුන්ට දිගු වේලාවක් ගුවන්යානාවෙන් ගමන් කිරීමට සිදු විය.

සෙනුරි කවුලුව අසල ආසනයෙන් අසුන් ගත්තේ එමගින් මනරම් දසුන් දැක බලා ගැනීමට හැකි නිසා ය. ඔවුන්ට මහ සයුරේ නිල්වන් ජල කඳ දැක ගැනීමට හැකි වූයේ අතරින් පතර යන්තමින් පමණි. එයට හේතුව එම දර්ශනයට වලාකුළු හරස් වීමයි. දිගු වේලාවක් එක ම ආකාරයේ දසුන් පෙළක් බැලීමට සිදුවීම නිසා සෙනුරිට බොහෝ වේලා යනතුරු නින්ද යන්නට ඇත. ඇය ඇහැරී බලන විට ගුවන් යානය බොහෝ දුරක් පැමිණ තිබුණි. මෙසේ ටික වේලාවක් ගමන් කරන විට ගොඩබිමක් දැකීමට ලැබුණි .

“ ඔන්න අපි ලංකාවට ආවා.” තාත්තා සතුටින් පැවසුවේ ය.

එය ඇසූ සැණින් සෙනුරි එය දෙස හොඳින් බලාගෙන සිටියා ය. ඇගේ දෙනෙත් මිණිකැට මෙන් දිලිසෙන්නට විය. හරිත වර්ණැති වෘක්ෂලතාවලින්, ගොඩනැගිලිවලින් එය පිරී තිබුණි. සෙනුරි ආසාවෙන් බලාගෙන සිටි ඒ මොහොත උදා විය. ඔවුහු ලංකාවේ ගුවන් තොටුපොළට පැමිණියෝ ය.

## 7. අලුත් පාසල

ලංකාවට පැමිණ දින පහක් ගත වී ඇත. ඔවුන්ගේ නිවස කුලියට ලබා දී තිබුණත් කුලියට සිටි අය මාස හයකට පමණ පෙර ඉවත් වී ගොස් තිබූ නිසා නිවස අපිළිවෙල වී තිබුණි. මිදුලේ වල් පැළ වැවී ඇත. නිවස යළි යථා තත්වයට පත් කිරීම මදක් අපහසු වී තිබුණි. සෙනුරිගේ අත්තම්මා එනම් ඇගේ අම්මාගේ අම්මා ඔවුන්ගේ නිවසට පැමිණියේ මෙම වැඩ කටයුතු වලට උදවු කිරීම සඳහා ය. ඉතා කරුණාවන්ත තැනැත්තියක් වූ ඈ කථා කිරීමට හපනියකි. උදවු කිරීම කෙසේ වෙතත් සෙනුරි හා සෙනුරට කතන්දර කියාදීමට, ඔවුන් අසන නොයෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට, ඔවුන්ගේ රණ්ඩු බේරීමට අත්තම්මාට සිදු ව තිබුණි. අත්තම්මා මේ පිළිබද කෝප ගත්තේ නැත. බොහෝ කාලයක් තම මුණුපුරා හා මිණිපිරිය සමග සිටීමට නොහැකිවීම නිසා ඇය ඔවුන් සමග සතුටින් කල් ගත කළා ය. මෙසේ සිටින විට ඔවුන්ට ලංකාවේ පාසලකට ඇතුලත් වීමේ දිනය එළඹුණි.

" දුව, එහේ ඉස්කෝලෙදිත් ඉංග්‍රිසියෙන් ම ඔක්කොම ඉගෙන ගත්ත නිසා මෙහෙදිත් ඉංග්‍රිසියෙන් ම ඉගෙන ගත්තොත් ඔයාට ලේසියි නේද?" අම්මා එය ඇසුවේ ඒ පිළිබද සෙනුරිගේ කැමැත්ත කුමක් දැ යි දැන ගැනීම සඳහා ය.

“ මම මෙහේදිත් ඉංග්‍රිසියෙන් ම ඉගෙන ගත්තොත් සිංහල දැන ගන්නේ කොහොමද? මෙහේ දී මම සිංහලෙන් ඉගෙන ගන්නම්. මුල් කාලෙදි සිංහල අමාරු වෙයි. පස්සේ හරි යයි නේද අම්මේ?”

“ ඔව් නේද ඔයාලා සිංහල ඉගෙන ගන්නත් එපායැ ඉතින්” කියා අම්මා පිටව ගියේ එය තාත්තාට කීමට විය යුතුය.

*　　　　*　　　　*

මේ, සෙනුරි ලංකාවේ පාසලකට යන පළමු දිනයයි. කුතුහලය පිරුණු අමුතු ම සතුටකින් යුතු ව උදෑසනින් ම අවදි ව සන්සුන් මනසකින් යුතු ව අළුත් පාසලකට යාමට අළුත් ඇඳුමින් සැරසුණු ඇය අම්මා ද තාත්තා ද සමග පාසලට ගියා ය. සෙනුරි ව ඇයගේ පන්තිභාර ගුරුතුමියට භාර දී දෙමව්පියෝ යන්නට ගියෝ ය. ඇය ගුරුතුමිය සමග සෙමින් සෙමින් පන්ති කාමරය කරා පියවර තැබුවා ය. කොරිඩෝවක් දිගේ ගමන් කළ ඔවුන් ඇතුළු වූයේ තරමක් විශාල පන්ති කාමරයකට යි. ඇතුළු වන විට ම පන්ති කාමරයේ තිබුණු සියළු ම මුහුණු සෙනුරි වෙත එල්ල වුයේ ඊතල මෙනි. ගුරුතුමිය ළමුන්ට සෙනුරි ව හඳුන්වා දී හිස් වී තිබු පුටුවක් පෙන්වා එහි වාඩි වෙන්න යැයි කීවා ය. සෙනුරිට එහා පැත්තේ සිටි මිතුරිය රුමත්, කාරුණික පෙනුමක් ඇති අයෙකි. සෙනුරි වාඩි වී ඇය දෙස බැලුවා ය. ඇය ද සෙනුරි දෙස බලා සිටියා ය. ඇය දැක පුරුදු බවක් සෙනුරිට දැනුණි.

“ඔයාට මාව මතක නැද්ද?” ඒ ඇගේ ප්‍රශ්නයයි. ටික වේලාවක් කල්පනා කල සෙනුරිට මීට පෙර දී ලංකාවේ ගත කල කාලය ටෙලි නාට්‍යයක් සේ පැවී පෙනුණි. එහි සෑම කොටසක ම පාහේ ඇය ලගින් ම සිටි ඇගේ හොද ම යෙහෙළිය ගිහන්සියි අද මේ අයුරින් මුණ ගැසී ඇත්තේ.

“ගිහන්සි” සෙනුරිට කියවුණි.

මිතුරියට තමා ව තවමත් අමතක වී නොමැති බව දැනගත් ගිහන්සිගේ සතුට ඇය ප්‍රකාශ කළේ ලස්සන සිනහවකිනි. සෙනුරිට ඇය වැළද ගැනීමට තරම් සතුටක් ඇති විය. ඒත් එසේ නොකලේ පන්තියේ ගුරුතුමිය සිටි නිසා ය. නොදන්නා පාසලකට පැමිණියත් ඇගේ හොද ම මිතුරිය ඇගේ ළග ම පුටුවේ සිටීම කොතරම් භාග්‍යක්ද!

# 8. කෝච්චියෙන් ගමනක්

මේ පාසල් නිවාඩු කාලයයි. නිවාඩුවට පෙර පාසලේ වාර විභාගය පැවැත්වුණි. වාර විභාගය ගැන නම් සෙනුරිට දුකයි. සෙනුරි පන්තියේ විසිවෙනියා ය. මේ ඇය අලුත් පාසලේ ලියූ පළමු වාර විභාගයයි. පිටරට පාසලේ සිටිය දී සැමදා පන්තියේ පළමුවැනියා වූ ඇයට මෙය තරමක් දුක් සහගත සිදුවීමකි. ඇයට තවමත් සිංහල ව්‍යාකරණ ආදිය හරි හැටි නොතේරේ. ඇය ඇතැම් සිංහල වචනවල තේරුම තවමත් හරි හැටි නොදනී. ඇය පන්තියේ වෙනියාගෙන් පහළ යාමේ හේතුව එයයි. ගිහන්සිගේ නිවස පිහිටා තිබෙන්නේ සෙනුරිගේ නිවසේ සිට ගෙවල් තුනකට පසුවය. සෙනුරි මුල දී සිතුවේ ඔවුන් දැන් එම නිවසේ නැතැයි කියාය. ඔවුන් දෙදෙනා බොහෝ විට වැඩ කරන්නේ එකටය. සෙනුරි ගිහන්සිලාගේ ගෙදරට පැමිණියා ය. නැතිනම් ගිහන්සි සෙනුරිගේ ගෙදරට පැමිණියා ය. ඔවුහු හොඳින් පාඩම් වැඩවල නිරත වූහ.

දිනක් අම්මා සෙනුරිගෙන් මෙසේ ඇසුවා ය.

"දුව අපි කෝච්චියෙන් ගමනක් යමුද?"

"අනේ හා යමුකෝ" ඇය සතුටින් කීවා ය.

"අම්මා අපි ගිහන්සිවත් එක්කන් යමුද?" සෙනුරි ඇගේ යෙහෙළියව අමතක නොකළා ය.

“ හා එක්කන් යමු” අම්මා සතුටින් පැවසුවා ය.

පසු දින උදෑසන ම පාසලට ගිය සැණින් සෙනුරි සිදු කලේ ගිහන්සිට මේ බව පැවසීම ය.

“ අපේ අම්මා කිව්වා කෝච්චියෙන් ගමනක් යමු කියල. ඔයත් එනවා නේද අපිත් එක්ක යන්න”.

“ඔයාල කොහේද යන්නේ”

“ඒක නම් හරියටම දන්නේ නෑ. මම අහල කියන්නම්කෝ”

“ඔයාල යන්න. මමත් ආවොත් එහෙම ඔයාලට කරදරයිනේ.”

“මොන කරදරයක්ද අනේ. යමු යමු අපිත් එක්ක.”

“අනේ ඔයාල යන්න කමක් නෑ.”

සෙනුරිගේ පෙරැත්ත නිසා ම ගිහන්සිට ගමන යාම සදහා කැමති වීමට සිදු විය.

* * *

මේ කෝච්චියේ යන දිනයයි. ඔවුන් දුම්රියේ යන්නේ කොළඹ සිට බදුල්ලටයි. ඔවුහු කොළඹ යාම සදහා බසයකට ගොඩනැගුණෝ ය. ඔවුන්ට කොළඹ යාම සදහා පැය තුනක් පමණ ගමන් කළ යුතු ය. දුර වුවත් ඔවුන් කොළඹ - බදුල්ල දුම්රිය මාර්ගය තෝරා ගත්තේ එහි ඇති දැකුම්කළු රමණීය පරිසර පද්ධතිය නිසා ය. සෙනුරි එම පරිසරයේ සුන්දරත්වය සිතින් මවා ගත්තා ය.

ඔවුහු බසයේ ගමන් කරමින් සිටියෝ ය. හිටි හැටියේ ම බසය නතරවුණි. කුමක් සිදු වෙනවා දැ යි ඔවුනට සිතා ගැනීමට නො හැකි විය.

“මේක ඉක්මනට හදන්න බැරි වුණොත් අපිට වෙලාවට කෝච්චියට යන්න බැරි වෙනවා.” තාත්තා කීවේ තරමක් තිගැස්මෙනි.

“ අයියෝ අපි දැන් මොකද කරන්නේ?” සෙනුරි ඇසුවේ ගිහන්සිගෙනි.

“ අපි තව ටිකක් බලමුකෝ මොකද වෙන්නේ කියලා” එය කීවේ ගිහන්සි ය.

බොහෝ වේලාවක් එතැන රැඳීමෙන් පසු බසය නැවත ගමන් ආරම්භ කළේ ය. ටික දුරක් යන විට ඔවුන් සැමගේ බලාපොරොත්තුව කඩ කරමින් දුම්රිය යන වේලාව පහුවුණි. ඔවුන්ට දැන් කර කියාගත දෙයක් නොමැත.

“ අපි එහෙනම් කොළඹ ගිහිල්ලා එහේ ටිකක් ඇවිදලා එමුද? ” ඒ අදහස සෙනුරගේ ය.

“ ඔව් අපි එහෙම කරමු. දැන් මෙහෙමම යමුකෝ” තාත්තා කීවේ ය.

සෙනුරිට ඇඬෙන්නට ඉතා ආසන්න විය. කොතරම් උත්සාහ කළත් කඳුළු නවතා ගැනීමට නොහැකි විය. ගිහන්සි ඇයව අස්වැසීමට උත්සාහ කළා ය. මේ වගේ දුක හිතෙන දවස් එන්නේ නැත්නම් කොච්චර හොඳද?. එහෙත් එම ප්‍රාර්ථනාව ඉෂ්ඨ වෙන්නේ නැත්තේ ඇයි?

## 9. වාර විභාගය

ඊළඟ නිවාඩුවත් අත ළඟ ම පැමිණෙයි. අද පාසලේ වාර අවසාන දිනයයි. සෙනුරි සිටියේ සතුටින් මෙන් ම කුතුහලයෙනි. එයට හේතුව වාර විභාගයේ ලකුණු දීමයි. විවේක කාලයෙන් පසු ගුරුතුමිය පන්තියට පැමිණියා ය. එහෙත් ඇයගේ අතේ ප්‍රගති වාර්තා නොවී ය.

“ ළමයි දැන් ඔයාලට ප්‍රශංසනීය ප්‍රගති වාර්තා දෙනවා. ඒක නිසා හැමෝම පිට්ටනියට යන්න.” ගුරුතුමිය ගණනකට නොගෙන පැවසුවා ය.

මැඩම්ට නම් මොකද? අපි එපෑ පන්තියේ කී වෙනියද කියල හිත හිතා බයේ ඉන්න. සෙනුරි එසේ සිතුවත් අපි වෙනුවෙන් ගුරුවරු කොතරම් මහන්සි වෙනවාදැ යි ඇයට තේරුම් ගියේ පසුව ය.

මෙවර සෙනුරිගේ ප්‍රගති වාර්තාව බොහෝ වේලා යන්නට පෙර විදුහල්පති අතින් ඇයට ලබා ගැනීමට හැකි විය. මෙතරම් ඉක්මනට ඇගේ නම කියවුණේ කෙසේ දැයි සෙනුරිට ද සිතා ගැනීමට නොහැකි විය. වරදක් සිදු වී ඇත් දැයි සැක හැර දැන ගැනීම සඳහා ඇය නැවත ප්‍රගති වාර්තාවේ නම දෙස බැලුවා ය. වරදක් සිදු වී නො මැත. එය ඇගේම ප්‍රගති වාර්තාව ය. ඇය එය පෙරලා බැලුවේ තරමක් බියෙනි. එහි සෙනුරි පන්තියේ දෙවෙනියා ලෙස සඳහන් කර තිබුණි. සුපුරුදු ලෙසම සෙනුරිගේ යෙහෙළිය ගිහන්සි පන්තියේ පළවෙනියා ගෙන තිබුණි.

ගිහන්සිට ඇගේ මිතුරිය පිළිබඳ ඇතිවූයේ ඉමහත් සතුටක් හා ආඩම්බරයකි.

“ ඔයාට කොහොම ස්තූති කරන්නද කියල මට හිතා ගන්න බෑ. ඔයා මට කොච්චර උදවු කරාද? ඒ හින්ද තමයි මට පන්තියේ දෙවෙනියා වෙන්න පුළුවන් වුණේ.” සෙනුරි මෙය ගිහන්සිට පැවසුවේ ඔවුන් නිවසට එමින් සිටින අතරතුරේදී ය.

“ අපි පොඩි කාලේ මට බැරි දේවල් ඔයා කොච්චර කියල දුන්නද? මට ඒවා තාම මතකයි. ඉතින් මමත් ඔයාට ඒ ණය ගෙවන්න එපැයි” ගිහන්සි සිනහ වෙවී පිළිතුරු දුන්නා ය. සෙනුරි ද සිනහවකින් ම ඇයට සංග්‍රහ කළා ය.

පන්තියේ විසි වැනියා වී සිටි සෙනුරි දැන් පන්තියේ දෙවෙනි ස්ථානය ගෙන ඇත. මෙයට හේතුව සෙනුරි ඉතාමත් මහන්සි වී පාඩම් වැඩවල නිරත වීමයි. පළමුවෙනියා වීමට නොහැකි වීම හේතුවෙන් සෙනුරි දුක් වූයේ නැත. ඇය තමන් ඉදිරියට පැමිණීම ගැන සතුටු වූවා ය. අප පුරුදු කර ගත යුත්තේ ද එයයි.

මේ සීතල උදුවප් මාසයයි. පාසල්වල ද නිවාඩු කාලය ලබා දී ඇති නිසා ළමයි විවේකී සුවයෙන් කල් ගත කළෝ ය. විවේකී සුවයෙන් කීවත් ඔවුන්ට අමතර පන්ති යැමට, පාසලෙන් දුන් ගෙදර වැඩ කන්ද නිම කිරීමට සිදු ව තිබුණි. සෙනුරි අරමුණක් නොමැතිව කාමරයේ ජනේලයෙන් එළිය බලාගෙන සිටියා ය. ඒ වෙලාවේ ගිහන්සි ඔවුන්ගේ වැට ළඟින් මතු වුණි. ගිහන්සිට ඇයට

වඩා අවුරුද්දකින් වැඩිමල් සහෝදරයෙකු සිටියා ය. ඔහුගේ නම කවීන් ය. ගිහන්සි සමග ඔහුත් සෙනුරිගේ නිවසට පැමිණ සිටියා ය.

# 10. ගල උඩ

එදා සෙනසුරාදා දවසකි. ඉතාමත් සෞම්‍ය කාලගුණයක් පැවතුණි. හිරු කුමරා හෙමින් හෙමින් ගම දෙස එබී බලමින් සිටියේ ය. සෙනුරි ඇගේ කාමරයට වී පාසලේ ගෙදර වැඩ නිම කරමින් සිටියා ය. ගෙදර වැඩ නිම වී පුටුවෙන් නැගිටිනවාත් සමග ම ගිහන්සි ඇගේ කාමරයට පැන සෙනුරි ව බය කළා ය. සෙනුරි පුටුවෙන් වැටෙන්නට ගොස් අනූ නවයෙන් බේරුණි.

“ අම්මෝ මම බය වුන තරමක් !.” සෙනුරි පැවසුවා ය. ගිහන්සි හඬනගා තාමත් සිනාසෙන ගමන් ය.

“ ඔයාටනම් හිනා”. සෙනුරි මවාගත් තරහකින් පැවසුවා ය.

“ හරි, හරි, මේ, මම ආවේ අපි අද අර ගල බලන්න යමුද කියලා අහන්න.

“ හා, යමුකෝ, ඔයා ඉස්කෝලේ ගෙදර වැඩ කරලා ඉවරද?”

“ අපි අයියවත් එක්කගෙන යමු.”

“ හා, හා, අපේ අයියත් ආවා ඔයාලගේ අයියව එක්කන් යන්න.”

“ අම්මේ, අපි මේ ගිහන්සිලාගේ ගෙදර ගාව තියෙන ගල බලලා එන්නම්”. සෙනුරි අම්මාගෙන් ඇසුවේ තරමක් දෙගිඩියාවෙනි.

“ ඔවගේ ගිහින් තුවාල එහෙම කරගන්නේ නෑ . තේරුණාද?” අම්මා කිවුවේ එයයි.

“ හරි, හරි අම්මා” යැයි කියා ඔවුන් ඉක්මණින් නිවසින් එළියට පැන ගත්තේ අම්මා තවත් යමක් කීමට පෙරය.

ගිහන්සිගේ නිවස සුන්දර පරිසරයක පිහිටා තිබුණි. ඇගේ නිවස ඉදිරිපසින් ගලා බසින කුඩා දොළ පහරකි. ඇගේ නිවස පිටුපස ඇත්තේ වෙල් යායයි. බැලූ බැලූ සෑම අත ම හරිත වර්ණයෙන් බබළන පුංචි පුංචි ගොයම් පැළ පිසගෙන හමා එන ගත සිසිල් කරවන මද සුළඟ ඉතාමත් නැවුම් ය. ඔවුහු එම වෙල් යාය මැදින් ඊට එහා පැත්තේ ඇති ගල් තලාවට සේන්දු වුණෝ ය. මිතුරෝ හෙමින් හෙමින් ගල මුදුනටම පැමිණියෝ ය.

“ අනේ හරිම ලස්සනයි. මේ ගල උඩ ඉන්නකොට වටේට තියෙන හැම දේම පේනවා.” සෙනුරි සතුටින් කීවා ය.

“ ඔව් ඉස්සර නම් අයියයි මමයි මෙතනට ආවා. ඒත් කාලෙකින් එන්න බැරි වුනා.” ගිහන්සි පැවසුවා ය.

මොවුන් මෙසේ කතා කරමින් සිටින අතරතුර සෙනුරි වට පිට බැලුවා. සෙනුරිගේ අයියා සහ ගිහන්සිගේ අයියා පෙනෙන්නට නැත.

“ මේ, කෝ අයියලා දෙන්නා. පේන්න නැනෙ.” සෙනුරි විමසුවාය.

ගිහන්සිටත් එය මතක් වූයේ සෙනුරි කියන විටය.

ගිහන්සි උස් හඬින් ඔවුන්ට කතා කලා ය. එහෙත් ප්‍රතිචාරයක් නොමැත. සෙනුරි හා ගිහන්සි සිටියේ ඔවුන් ගලට නැගුනු ස්ථානයට පැමිණ පහල බැලුවෝ ය. දුටු දෙයින් සෙනුරි හා ගිහන්සිට යකා ආවේස විය. සහෝදරයෝ දෙදෙනා කන්ද පාමුල සිට සිනහ වෙවී ඔවුන්ට අත වනා එතැනින් යන්නට ගියෝ ය.

“ බලන්නකෝ අනේ මේ දෙන්නා. අපිව දාල යන්න ගියා. හරිම නරකයි.” සෙනුරි තරහින් පුපුරමින් කීවා ය.

“ ඔව් අනේ, කමක් නෑ. ඒගොල්ලෝ කොහොමත් එහෙම තමයි. දැන් ඉතින් අපි දෙන්නත් ගෙදර යමු.” ගිහන්සි පැවසුවා ය.

සෙනුරි හා ගිහන්සි තම නිවෙස් බලා පියවර තැබුවේ අයියලා දෙන්නාට හොද පාඩමක් උගන්වන්නට සිතාගෙන ය.

# 11. ගුහාව

සෙනුරි හා සෙනුර පාසල් ගොස් ගෙදර පැමිණියෝ ය. එදින ඔවුන් දෙදෙනාටම පාසලේ ගෙදර වැඩ නොමැති වීම පුදුමයකි. සෙනුරිට මහා අලසකමක් දැනුණි. ගිහන්සි ද මේ දිනවල පාසලට පැමිණෙන්නේ නැත. ඇය සහ ඇගේ පවුලේ අය හදිසියේ ම නෑදෑ ගෙදරකට ගොස් තිබුණි. ඇය ඇගේ අයියා වෙතට ගියා ය.

" අපි අර ගල බලන්නවත් යමුද? මට කම්මැලියි අනේ." සෙනුරි පැවසුවා ය.

" හා. හැබැයි අම්මා එපා කියයි ද දන්නේ නෑ."

" නෑ. නෑ. අපි ගල උඩට නගින්නේ නැතිව ඉක්මනට එමු. ඔවුහු අම්මාගෙන් ඉතා අමාරුවෙන් අවසර රැගෙන ගල අසළට ගියහ. ගලට නැගීමට ද නොහැකි ය. පහල සිටියා කියා කිරීමට දෙයක් ද නොමැත. ඔවුහු ගල වටේට ඇවිද ගියෝ ය. ගලෙහි එක් තැනක ඔවුන් දුටුවේ මින් පෙර නොසිතූ විරූ දෙයකි. එය විශාල ගල් ගුහාවකි. මහා ගල් පර්වතයේ මැද කොටසට පමණ යන තෙක් ම ගුහාව විහිදී තිබුණි.

" අපි මේ ගුහාව ඇතුලට යමුද?" සෙනුර ඇසුවේ ය.

“ දැන් හවස් වෙලා. හෙට සෙනසුරාදානේ. අපි හෙට එමු.” සෙනුරි එසේ පැවසුවේ, කළුවර වැටීමට ආසන්න වෙලාවේ දී මෙම අඳුරු ගුහාව තුලට යාම භයානක බැවිණි.

පසු දින උදාවන තුරු සෙනුරි ඇඟිලි ගනිමින් බලා සිටියා ය.

# 12. පුදුමයකි

මෙදින සෙනුරි උදෑසනින් ම නැගිට කල්පනා කළේ ගුහාවට යාම සඳහා අම්මාගෙන් අවසර ලබා ගත හැකි මාර්ගයක් ගැන ය. අද නම් අම්මා කිසි සේත් ම ගුහාවට යාමට අවසර නොදෙනු ඇත.

“ ඔය ගල ගාවට ගියා කියලා මොනවා කරන්නද?. වැඩකට නැති දේවල් කරන්නේ නැතුව ගෙදරට වෙලා පාඩම් වැඩක් කර ගන්න.” යනුවෙන් අම්මා කියනු ඇත. එවිට ම අම්මා කාමරයට පැමිණ,

“ මම අද බඩු වගයක් ගන්න කඩේට යනවා. බඩු ගොඩක් ගන්න තියෙන නිසා මම එනකොට ටිකක් දවල් වෙයි. ඔයාල දෙන්නට තනියෙන් ඉන්න පුළුවන්ද? නැත්නම් මාත් එක්ක එනවාද?” අම්මා ඇසුවා ය.

සෙනුරිට දැනුණේ නිම් හිම් නැති සතුටකි. ගුහාවට යන්න තියෙන හොඳම වෙලාව මෙයයි.

“ නෑ .නෑ . අම්මා කමක් නෑ . අපිට ගෙදර ඉන්න පුළුවන්. තනියක් නෑ. එහා ගෙදර නැන්දලත් ඉන්නවනේ.” යනුවෙන් සෙනුරි පැවසුවා ය.

“ එහෙනම් පරිස්සමෙන් ඉන්න ඕනෙ. එහෙ මෙහෙ තුවාල කරගෙන එහෙම එන්නේ නෑ . තේරුනා ද?” ඒ අම්මාගේ අවවාදයයි.

“ හරි අම්මා.” සෙනුරි පැවසුවේ බොරුවකි. අම්මා ගිය පසු ඔවුන් ගුහාවට යනවා නිසැක ය. අම්මා ටික වේලාවකින් පිට වූවා ය.

“ නංගී. එන්න අපි යමු.”

“ හරි. හරි. ඉක්මනට ගිහින් ඉක්මනට එමු.” සෙනුරි නිවසේ තිබූ විදුලි පන්දමක් ද අර ගත්තා ය. ඔවුහු ගුහාව තිබුනු තැනට ළගා වූවෝ ය. හිරු එළිය හොඳින් වැටී තිබුණත් ගුහාව තුළ ඇත්තේ මළානික කුඩා එළියක් පමණි. සෙනුර සහ සෙනුරි සෙමෙන් සෙමෙන් විදුලි පන්දම ද දල්වාගෙන ගුහාව තුළට සේන්දු වුණෝ ය. ගුහාව තුළ තිබූ ඉතා ඝන දූවිළි තට්ටු, මකුළු දැල්, එයින් හමාගෙන එන පුස් ගඳ එය ඉතා පැරණි ගුහාවක් බවට සාක්ෂි සැපයුවේ ය. ඔවුන් මෙසේ ගුහාව පරීක්ෂ කරමින් සිටිය දී එක් තැනක ඍජුකෝණාස්‍රාකාර තරමක් විශාල කොටුවක් ගලෙහි කොටා එහි මැදට වන්නට යම් අකුරු ජාතියක් ද කොටා තිබුණි. පොඩි දෙයක් ලියලා ඒක වට කරලා මෙච්චර ලොකු කොටුවක් කොටලා තියෙන්නේ මොකට ද? මොවුන් දෙදෙනාට ම මෙය ප්‍රශ්නයක් විය.

“අපි මේක තල්ලු කරමු” එය සෙනුරිගේ අදහස විය.

“ මේක මොකටද තල්ලු කරන්නේ?”

“ වෙන දෙයක් වෙයිනේ මේක තල්ලු කරමු” සෙනුරි අදහස අත්හැරියේ නැත.

ඉන් පසු ඔවුන් දෙදෙනා ම එම කොටුවට අත් තබා හැකි වෙර යොදා එය තල්ලු කරන්නට විය. කිසිවක් සිදු වූයේ නැත. ඔවුන් දෙවෙනි වරටද උත්සාහ කළෝ ය. සිදු වූයේ ඔවුන් කිසිදා නොසිතූ දෙයකි මෙය තවත් කුටියකට ඇති දොරටුවකි. එය විශාල ශබ්දයක් නිකුත් කරමින් විවෘත විය. එයින් විවෘත වූයේ අඩකටත් වඩා අඩු ප්‍රමාණයකි. ගලින් නිම කර තිබීමත්, බොහෝ කාලයකින් විවෘත කර නොතිබීමත් නිසා දොර සම්පූර්ණයෙන් විවෘත කිරීමට නො හැකි විය. එය සම්පූර්ණයෙන් ම මකුළු දැල් වලින් වැසී තිබුනි. සෙනුර හා සෙනුරි අපහසුවෙන් එම එම කුටිය තුළට ඇතුළු වුණෝ ය. එහි එක් පසෙක තිබුණේ ගලින් කෙටූ සෙල්ලිපියකි.

මෙම කුටියේ එක් තැනක සෙනුරි පෙර දුටුවා සේ ම කොටුවක් කොටා තිබෙනු දුටුවා ය. එය පෙර කොටුවට වඩා ඉතා කුඩා විය. ඔවුහු එය ද තරමක් අපහසුවෙන් විවෘත කර ගත්තෝ ය. එතුල තිබුණේ කුඩා පෙට්ටියකි. දූවිලි වලින් එය වැසී තිබුණි. සෙනුර හා සෙනුරි එම පෙට්ටිය ඉවතට ගත්තත් එය විවෘත කිරීමට නොහැකි විය. සෙනුරිට නිවස මතක් වූයේ ඒ වෙලාවේ දී ය.

“ අයියෝ! අම්මා ගෙදර ආවද දන්නෙ නෑ. අපි ගෙදර හිටියෙ නෑ කියලා දැනගත්තොත් එහෙම ගුටි කන්න තමයි වෙන්නේ.” සෙනුරි කීවේ තරමක් බියෙනි.

“ අපි හොයා ගත්ත දේවල් අම්මවත් එක්කගෙන ඇවිත් පෙන්නමු. එතකොට මුකුත් කියන්නේ නැතිවෙයි.” සෙනුර පැවසුවේ ය.

“ දැන් අපි මේ ඔක්කොම තිබ්බ තැනින් ම තියලා ඉක්මනට ගෙදර යමු.”

ගුහාව පෙර තිබූ පරිදි ම සකස් කළ ඔවුහු ඉක්මනින්ම නිවස කරා ළගා වූවෝ ය.

## 13. දැනුම් දීම

පසු දින සෙනුර හා සෙනුරි අම්මාට ඔවුන් සොයා ගත් දේ පෙන්වූහ.

“ අපි මේ ගැන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දැනුම් දෙමු.” එය අම්මගේ අදහස විය.

“ අම්මේ, අපි ගිහන්සිලත් එනකම් ඉමුද?”

“ බැහැනේ දුව, බැරි වෙලාවත් මේ ගුහාවට හොරු පැන්නොත් එහෙම මේ පෙට්ටිය හොයා ගනියි. එහෙම වුනොත් අපිට ඒක දැනුම් දෙන්න බැරි වෙනවා. සමහර විට මේ ගුහාවේ තවත් දේවල් තියෙන්න ඇති. ඒවත් මංකොල්ලකාරයෝ ඇවිත් අරන් ගියා ද දන්නේ නැහැනේ. ඒක හින්දා අපි ඉක්මනට ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දැනුම් දෙමු.” එය අම්මාගේ පිළිතුර විය.

පසුව අම්මා මෙය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නා ය.

*   *   *

පසු දින නිළධාරින් කිහිප දෙනෙක් මේ පිළිබද සොයා බැලීම සදහා පැමිණ සිටියෝ ය. සෙනුර හා සෙනුරිගේ වාසනාවට මෙන් දවස් තුනක නිවාඩුවක් ලැබී තිබීම නිසා මෙදින මොවුන්ට නිවසේ සිටීමට හැකි විය. සෙනුර හා සෙනුරි ඔවුන් සොයා ගත් දේවල් නිලධාරින්ට පෙන්වීමට කටයුතු කළෝ ය.

ඔවුන් සොයා ගත් පෙට්ටිය එම නිලධාරිහූ විවෘත කළෝ ය. එහි තිබුණේ රන් කහවනු කිහිපයක් සහ යමක් ලියා තිබූ කුඩා රන් පතකි. මෙම ද්‍රව්‍ය බොහෝ වේලාවක් නිරීක්ෂණයට භාජනය කල මෙම පුද්ගලයන්ගෙන් එක් අයෙකු සෙනුරි හා සෙනුර අසළට පැමිණ මෙසේ පැවසුවේ ය.

“ මේ වගේ තැනක මෙහෙම දෙයක් තියෙන්න ඇති කියලා හිතන්නත් අමාරුයි. ඔය ළමයි දෙන්නා හොයාගෙන තියෙන්නේ ඉතාමත් වටිනා පුරාවස්තුවක්. ඔය දෙන්නා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට කළේ ලොකු සේවයක්.”

සෙනුරට හා සෙනුරිට දැනුනේ නිම් හිම් නැති සතුටකි. පසු දින පැමිණි ගිහන්සිත් මෙය අසා ඉතා සතුටට පත් වූවා ය.

“ ඔයා මීට කලින් මේ ගුහාව දැකලා තිබුනේ නැද්ද?”

සෙනුරි මෙතෙක් කල්පනා කරමින් සිටි ප්‍රශ්නය ගිහන්සි වෙත ඉදිරිපත් කළා ය.

“ දැකල තිබුණා, ගුහාව ඇතුලට හිගිල්ලත් තියෙනවා. ඒත් කවුද හිතන්නේ එතන දොරක් තියෙනවා කියලා? ඔයාට විතරයි ඒක හිතුනේ.” ගිහන්සි සිනාමුසු මුහුණකින් පිළිතුරු දුන්නා ය.

*   *   *

පසු දින උදෑසන ම සෙනුරිට හා සෙනුරට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් තෑග්ගක් එවා තිබුණි. ඔවුන් කල වික්‍රමය අගයමින් ඉතා වටිනා සහතිකපත් දෙකක් සහ පදක්කම් දෙකක් ත්‍යාග වශයෙන් ඔවුන්ට හිමි විය.

*    *    *

නිමි ......

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-645-3